**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2013**
--------------------------

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(3) වගන්තිය ප්‍රකාර ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1:2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

ස්ථාවර තැන්පතුවලට අදාල පොළිය නියමිත පරිදි ගණනය නොකිරීම හේතුවෙන් ආයෝජන වටිනාකම හා ඒ මත ලැබිය යුතු මුදල රු.97,562 ක් අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම්

පහත දැක්වෙන සාක්ෂි නොමැතිවීම් නිරීක්ෂණය විය.

| | විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | i. සතර දේවාලයට මුදල් ලබාදීම | 4,000,000 | ආධාර මුදල ලද බවට කුවිතාන්සිය වියදම් ඇස්තමේන්තු හා වියදම් වාර්තා |
| | ii. දළදා මාලිගාවට ආධාර මුදල් ලබා දීම | 1,500,000 | |
| (ආ) | ඇත් තටාංගනය | 73,350 | ස්ථාවර වත්කම් ලේඛනය |
| | උපකරණ | 25,250 | |
| (ඇ) | ඡායාරූප වියදම | 79,500 | වියදම් ඇස්තමේන්තු |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කාර්ය මණ්ඩලයේ වියදම් | 250,750 | සේවයේ යෙදවීමේ ලිපි |

2.2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරයේ පනත | |
| (i)8 (1) වගන්තිය | ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ, මහනුවර සතර දේවාලයේ බස්නායක නිලමෙවරුන් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශන කමිටුවක් පත් කරනු ලැබිය යුතු වුවත් ඇසල භාරය විසින් එම කමිටුව පත් කර නොතිබුණි. |
| (ii)16 (3) වගන්තිය | භාරයේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 168 | රජයට අනුබද්ධ සමාගමකින් ලැබුණු රු.125,000 ක් මුදල් සඳහා ලදුපතක් නිකුත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: PF/423, 04.1 ඡේදය | විගණනයට ඉදිරිපත් කළ අයවැය ලේඛනයට අදාළ අමාත්‍යවරයාගේ සහ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) | 2006 භාණ්ඩ හා වැඩ පිළිබඳ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 1.2.1 | මිලදී ගැනීමේදී අවශ්‍ය පිරිවිතරයන් පිළිබඳ අවධානය යොමු නොකර, සැපයුම්කරුවන්ගේ පිරිවිතරයන් පදනම් කර ගැනීම හේතුවෙන් අවම මිලට වඩා රු.26,596 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.753,631 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.10,738 ක ඌනතාවයක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.764,369 ක ශුද්ධ වර්ධනයක් දක්නට ලැබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇසළ පෙරහැර භාරයේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 4 ක සියයට 17 සිට සියයට 150 දක්වා වූ පරාසයකින් යුක්ත වැඩිවීමක් දක්නට ලැබුණ අතර, නිර්වින්දන කාර්ය මණ්ඩලයට ගෙවීම හැර සෑම වියදම් විෂයයකම සියයට 7 සිට සියයට 99 දක්වා වූ පරාසයක වැඩිවීමක් දක්නට ලැබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 හඳුනා ගන්නා ලද පාඩු

----------------------------

මහා භාරකරු භාරයේ පවතින රු.20,000,000 ක් වූ ආයෝජන මුදලට අනුව ඒ ඒ වර්ෂවල පොළී මුදලට අනුරූපී පොළී මුදලක් මහා භාරකරු විසින් ගණනය කර, ඉන් සියයට 4 ක මුදලක් අඩුකර ගෙන පෙරහැර කටයුතු සඳහා ගෙවීම් කරනු ලබයි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.2,000,000 ක් වූ පොළී මුදලෙන් රු.80,000 ක් භාරයට අහිමි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් හා සමාලෝචිත වර්ෂය ඇතුළත්ව ඉදිරි වර්ෂ තුනක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂිකව දරනු ලැබූ නිර්වින්දන කාර්ය මණ්ඩල දීමනා සඳහා සමාලෝචිත වර්ෂයේ දී පූර්ව වැය ඇස්තමේන්තුවකින් තොරව රු.70,000 ක වියදමක් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තු වියදම් සහ තථ්‍ය වියදම් අතර වැය විෂයයන් 04 ක සියයට 11 සිට සියයට 24 දක්වා වූ පරාසයක විචලනයක් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) භාරයේ පරමාර්ථ ළඟා කර ගැනීම
(ඇ) වියදම් දැරීම
(ඈ) ආයෝජන
(ඉ) අයවැය ලේඛනමය
(ඊ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම